2024.09

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

## භූගෝල විද්‍යාව

විභාග අංකය ........................................................

Learning Resource Centre

| 11 ශ්‍රේණිය | I හා II පත්‍රය | කාලය පැය 03 |
|---|---|---|

## භූගෝල විද්‍යාව 1

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විත ය.
- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව සියළුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.

- **අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

1. ගෝලීය මුළු ජල ප්‍රමාණයෙන් ................................................ ක් සාගර ජලය වේ. (71%, 85%,97.5%).
2. පෘථිවි කබොල ප්‍රාවරණයෙන් වෙන් වන්නේ .................................... අසන්තතියෙනි. (කොන්රඩ්, මොහොරොවිසික්,ගුටෙන්බර්ග්).
3. ශ්‍රී ලංකාවේ මැදරට තේ වගාවට වැදගත් වන දිස්ත්‍රික්කයකි .................................. (ගම්පහ, කෑගල්ල, බදුල්ල)
4. ශ්‍රී ලංකාවේ බලශක්ති ප්‍රභව භාවිතය තුළ ප්‍රමුඛ වන්නේ ..........................................(ජෛව ස්කන්ධ , පෙට්‍රෝලියම්, ගල් අඟුරු)
5. දකුණු ආසියාතික කලාපයේ රටවල් අතුරෙන් ජනසංඛ්‍යාවේ වාර්ෂික වර්ධන වේගය අඩුම රට ............................................ යි. (මාලදිවයින, ශ්‍රී ලංකාව, ඉන්දියාව)

- **අංක 6 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් 'නි' යන්න වටාද වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.**

6. "නොරින් දහය" නමින් හැඳින්වෙනුයේ වැඩි ඵලදාවක් සහිත තිරිඟු වර්ගයකි. ( නි / වැ )
7. ශ්‍රී ලංකාවේ පස්වර්ග අතුරෙන් රතු දුඹුරු පස වියළි කලාපයට සීමාවූ පසක් ලෙස හැඳින්විය හැකි ය. ( නි / වැ )
8. ලෝකයේ මුළු බිම් ප්‍රමාණයෙන් 65% ක් පමණ ජනාධික ප්‍රදේශ වේ. ( නි / වැ )
9. ශාක පත්‍රවල ඇති ජලය උත්ස්වේදනය වීමෙන් ඒවා වායු ගෝලයට එකතු වේ. ( නි / වැ )
10. රිටිගල ශ්‍රී ලංකාවේ දැඩි ස්වභාවික රක්ෂිතයක් ලෙස නම් කර ඇත. ( නි / වැ )

- **අංක 11 සිට 19 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

11. සංයුතිය අනුව පෘථිවි පද්ධතියේ උප පද්ධති ගණන .............................. කි.
12. ලැව්ගිනි ............................................ උපද්‍රවයක් ලෙස හැඳින්විය හැකි ය.
13. 1:50000 පරිමාණිය ශ්‍රී ලංකා භූ ලක්ෂණ සිතියම්වල සමෝච්ච රේඛා අන්තරය .....................m. කි
14. දකුණු අක්ෂාංශ අංශක 23 ½ , ............................................ නිවර්තනය ලෙස හැඳින්වේ.
15. ශ්‍රී ලංකාවේ සුළු අපනයන බෝග මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ ...................................... ය.

- අංක 16 සිට 19 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාර සටහන උපයෝගී කරගන්න. 2022 වර්ෂයේ ශ්‍රී ලංකාවේ යල කන්නයේ වී නිෂ්පාදනය පිළිබඳ සංඛ්‍යා දත්ත එම ප්‍රස්තාරයෙන් දක්වා ඇත.




16. 2022 වර්ෂයේ ශ්‍රී ලංකාවේ යල කන්නයේ වැඩිම වී නිෂ්පාදනයක් සිදුකර ඇත්තේ ........................ දිස්ත්‍රික්කයේ ය.

17. යල කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 100000 ඉක්මවා ඇති දිස්ත්‍රික්ක ගණන............ කි.

18. ශ්‍රී ලංකාවේ යල කන්නයේ වී නිෂ්පාදනයේ වැඩි දිස්ත්‍රික්ක ප්‍රමාණයක, නිෂ්පාදනය මෙට්‍රික් ටෝන් ......................... ට වඩා අඩුය.

19. ශ්‍රී ලංකාවේ යල කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ට්‍රොන් 50,000 වන්නේ කුමන දිස්ත්‍රික්කයේ ද?
..............................................

- අංක 20 සිට 24 තෙක් දී ඇති ප්‍රශ්නවල 'අ' සහ 'ආ' යනුවෙන් තීරු දෙකක් දැක්වේ. 'අ' තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙලට අනුව 'ආ' තීරුවේ ඇති තොරතුරු ගැලපූ විට නිවැරදි අනුපිළිවෙල දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉරි මත ලියා දක්වන්න.

20.

| "අ" | "ආ" |
|---|---|
| 1. බුලත් | A. දඹදෙණිය |
| 2. කජු | B. රාජාංගනය |
| 3. මිරිස් | C. කටුගම්පොළ |
| | D. කෑගල්ල |

(1) A, B, D (2) B, C, A (3) D, C, B (4) C, A, B

(……)

21.

| "අ" | "ආ" |
|---|---|
| 1. රොකී කඳු | A. අප්‍රිකා මහද්වීපය |
| 2. නයිල් ගංගාව | B. උතුරු ඇමෙරිකාව |
| 3. ටිටිකාකා විල | C. ඔස්ට්‍රේලියාව |
| | D. දකුණු ඇමෙරිකාව |

(1) B, A, D (2) A, B, C (3) B, C, D (4) A, C, D

(……)

22.

| "අ" | "ආ" |
|---|---|
| 1. ඉහළ වටතීරුව | A. දිශාව |
| 2. පහළ වටතීරුව | B. අක්ෂාංශ දේශාංශ |
| 3. ඇතුළු මායිම් තීරුව | C. සිතියම් පත්‍රයේ නම |
| | D. සිතියම් මුහුණත |

(1) A, B, C (2) B, C, D (3) C, A, B (4) D, B, A

(……)

33. ශ්‍රී ලංකාවේ ධමනි මිනිරන් වැඩි ප්‍රමාණයක් මිලදී ගන්නා රට වන්නේ,
(1) චීනය (2) ඉන්දියාව (3) ඇමරිකා එක්සත් ජනපදය (4) ජපානය
(......)

34. නයිල් ගඟ ආරම්භ වන්නේ
(1) උල්පතකිනි (2) වර්ෂාපතනයෙනි (3) විලකිනි (4) ග්ලැසියර දිය වීමෙනි
(......)

35. 1:50000 පරිමාණයට අඳින ලද ශ්‍රී ලංකාවේ භූලක්ෂණ සිතියමක් මත 4 $cm^2$ කින් දැක්වෙන ප්‍රදේශයක් සැබෑ භූමියෙහි වර්ග කිලෝමීටර කීයක් වේ ද?
(1) 1 $km^2$ කි (2) 2 $km^2$ කි (3) 3 $km^2$ කි (4) 4 $km^2$ කි
(......)

36. පෘථිවි ව්‍යුහයට අනුව 670km-2900km අතර පිහිටා ඇත්තේ,
(1) කබොල යි (2) ඉහල ප්‍රාවරණය යි (3) පහළ ප්‍රාවරණය යි (4) පිටත හරය යි
(......)

37. ශ්‍රී ලංකා භූ ලක්ෂණ සිතියම්වල දක්නට ලැබෙන සංස්කෘතික ලක්ෂණයකි,
(1) කඳුවැටිය (2) මාර්ග (3)ගංගා (4) වනාන්තර
(......)

- පහත A, B, C හා D වලින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක 38 සිට 40 තෙක් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A- 1. පොසිල ඉන්ධන දහනය
2. පුනර්ජනනීය බලශක්ති

B- 1. කාර්මීකරණය
2. පාරිසරික විසංතුලනය

C- 1. පාංශු ඛාදනය
2. භූමි පරිහරණය

D- 1. තොරතුරු සන්නිවේදනය
E- 2. සමාජ සංවර්ධනය

38. පළමුවැන්නේ අහිතකර ප්‍රතිඵල අවම කිරීමට දෙවැන්න බලපාන බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D
(......)

39. පළමුවැන්නේ වැඩිවීම දෙවැන්නට හේතුවක් වන බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D
(......)

40. පළමුවැන්නේ දියුණුව දෙවැන්නේ යහපතට මෙන් ම අයහපතට ද හේතුවන මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D
(......)

23. "අ" / "ආ"

| "අ" | "ආ" |
|---|---|
| 1. භූ විද්‍යාත්මක උපද්‍රව | A. සුළි සුළං,අකුණු පහර |
| 2. දේශගුණික උපද්‍රව | B. වසංගත රෝග |
| 3. ජීව විද්‍යාත්මක උපද්‍රව | C. භූමි කම්පා,ගිණිකඳු |
| | D. සුනාමි, ජලගැලීම් |

(1) A, B, C (2) B, C, D (3) C, A, B (4) D, B, A

(……)

24. "අ" / "ආ"

| "අ" | "ආ" |
|---|---|
| 1. 16% | A. ආසියාව |
| 2. 10% | B. අප්‍රිකාව |
| 3. 60% | C. යුරෝපය |
| | D. උතුරු ඇමෙරිකාව |

(1) B, C, A (2) A, D, B (3) D, C, A (4) C, D, A

(……)

- අංක 25 සිට 37 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.

25. ලෝකයේ ප්‍රධාන ජන සංකේන්ද්‍රණවලට අයත් නොවන්නේ,

(1) නැගෙනහිර ආසියාව (3) වයඹදිග යුරෝපය
(2) දකුණු හා අග්නිදිග ආසියාව (4) මධ්‍යම ඔස්ට්‍රේලියාව

(……)

26. අන්තර්ජාතික සාගර නීතියට අනුව "යාබද කලාපය" විහිදෙන්නේ නාවික සැතපුම්

(1). 0-12 (2) 12-24 (3) 24-48 (4) 24-200

(……)

27. පෘථිවි ශිලා ගෝලය එකිනෙකට සම්බන්ධ ප්‍රධාන භූ තැටි කිහිපයකින් යුක්ත වෙයි. එම ප්‍රධාන භූත තැටි ගණන

(1). 5 කි (2) 6 කි (3) 7 කි (4) 4. 9 කි

(……)

28. නිවර්තන කලාපය යනු,

(1) කර්කට නිවර්තනයත් සමකයත් අතර කලාපයයි.
(2) කර්කටක නිවර්තනයත් මකර නිවර්තනයත් අතර කලාපයයි.
(3) මකර නිවර්තනයත් ඇන්ටාක්ටික් වෘත්තයත් අතර කලාපයයි.
(4) සමකයත් මකර නිවර්තනයත් අතර කලාපයයි.

(……)

29. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව මිලියනය ඉක්මවා නොමැති දිස්ත්‍රික්කයක් වන්නේ,

(1) කුරුණෑගල (2) මන්නාරම (3) මහනුවර (4) රත්නපුරය

(……)

30. මානුෂ සංවර්ධන දර්ශකය ගණනය කිරීම සඳහා යොදා නොගන්නා නිර්ණායකයක් වන්නේ,

(1) උපතේදී ආයු අපේක්ෂාව (2) සාක්ෂරතාව
(3) දළ ජාතික නිෂ්පාදනයේ වර්ධන වේගය (4) ක්‍රය ශක්තිය සහ ගැලපූ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය

(……)

31. මාරවිල, නාත්තන්ඩිය, හලාවත, මාදම්පේ වැනි ප්‍රදේශවල බහුලව ව්‍යාප්තව ඇති ඛනිජ සම්පත වන්නේ,

(1) ඉල්මනයිට් (2)රුටයිල් (3)සර්කෝන් (4)සිලිකා

(……)

32. අවසාදිත පාෂාණ යුගලයකට නිදසුනක් වන්නේ,

(1) හුණුගල්, ගල් අඟුරු (2) දියමන්ති, කිරිගරුඬ
(3) ග්‍රැනයිට්, බැසෝල්ට් (4) ඩොලමයිට් මිනිරන්

(……)

2024-09



Learning Resource Centre De Mazenod College Kandana

## භූගෝල විද්‍යාව II

- මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් දෙකකින් සමන්විත ය.
- I කොටසේ 1 ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් තුනට ම පිළිතුරු සැපයිය යුතු ය.
- දෙක කොටසින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

### I කොටස

1. (අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකාවේ 1:50000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර, ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය (පිටු අංක 8)යොදා ගන්න. අංක i සිට vii තෙක් අසා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

   i. A-B රේඛාවෙන් දක්වා ඇත්තේ කුමක් ද?
   (කඳුවැටිය / කපොල්ල / නිම්නය) (ලකුණු 01)

   ii. E-F රේඛාවෙන් දක්වා ඇති භූ ලක්ෂණය කුමක් ද?
   (උත්තල බෑවුම / අවතල බෑවුම / මද බෑවුම) (ලකුණු 01)

   iii. J-K රේඛාවෙන් දක්වා ඇති භූ ලක්ෂණය කුමක් ද?
   (තෙරුව / නිම්නය / කපොල්ල) (ලකුණු 01)

   iv. P චතුරස්‍රය තුළ ඇති සංස්කෘතික ලක්ෂණ දෙකක් වන්නේ,
   (පාසල, පොලිසිය / තැපැල් කාර්යාලය,පාසල / පාසල,උප-තැපැල් කාර්යාලය) (ලකුණු 01)

   v. D චතුරස්‍රය තුළ දක්නට ලැබෙන ජනාවාස රටාව වන්නේ,
   (පොකුරු / රේඛීය / විසිරුණු ) (ලකුණු 01)

   vi. A5 මාර්ගයේ දිග ආසන්න වශයෙන් කිලෝමීටර් කොපමණද? (ලකුණු 01)

   vii. සිතියම් ප්‍රදේශයේ දක්නට ලැබෙන ප්‍රධාන භෝග වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

   viii. සිතියම් ප්‍රදේශයේ මධ්‍යයේ ජනාවාස සීමා වීම කෙරෙහි බලපා ඇති භෞතික සාධක දෙකක් නම් කරන්න (ලකුණු 02)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව ඇති තීරුව (පිටු අංක 9 ) යොදා ගන්න.

- අංක i සිට v තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබදව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

| | | |
|---|---|---|
| i. | ඉරාන සාන්දුව | Q, R, S |
| ii. | කැලිෆෝනියාව | I, J, K |
| iii. | සැම්බිසි ගඟ | U, V, W |
| iv. | බීජිං නගරය | A, B, C |
| v. | තස්මේනියාව | L, M, N |

(ඉ) සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබදව ඇති තීරුව (පිටු අංක 9 ) යොදාගන්න.

- අංක i සිට v තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබදව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

| | | |
|---|---|---|
| i. | කන්කසන්තුරේ | A, B, C |
| ii. | ත්‍රිකුණාමලය | O, P, Q |
| iii. | බූන්දල | U, V, W |
| iv. | කහටගහපතල | G, H, I |
| v. | නොරච්චෝලේ | D, E, F |

## II කොටස

2.

i. ශිලා ගෝලයට අයත් වන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ලකුණු 02)

ii. a. ව්‍යුහය අනුව පෘථිවි ස්තර අතුරෙන් ප්‍රාවරණය හා හරය වෙන් කෙරෙන සීමාව හඳුන්වන නම කුමක් ද? (ලකුණු 01)

b. ජෛව ගෝලයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපාන ජෛව සාධකයක් සහ අජෛව සාධකයක් පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)

iii. ජලයේ ගුණාත්මකභාවය අඩුවීම කෙරෙහි බලපාන මිනිස් ක්‍රියාකාරකම් තුනක් නම්කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

3.

i. ලෝකයේ තිරිඟු වගා කරන ප්‍රධානතම රටවල් දෙක පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)

ii. ලෝකයේ සෞම්‍ය කලාපීය ප්‍රදේශවල කිරිපට්ටි පාලනය වැඩි වශයෙන් ව්‍යාප්තවීම කෙරෙහි බලපා ඇති සාධක තුනක් නම් කරන්න. (ලකුණු 03)

iii. කිරිපට්ටි පාලනය ආශ්‍රිතව දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ තුනක් නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

4.

i. ශ්‍රී ලංකාවේ වී වගා කරනු ලබන ප්‍රධාන කලාප ඇතුළත් සිතියමක් යාබදව දැක්වේ එහි සඳහන් අංක 1 සහ 3 පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 05)




ii. ශ්‍රී ලංකාවේ සුළු අපනයන භෝග කෙරෙහි විශේෂ අවධානයක් යොමුවීමට බලපෑ හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. ධීවර කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ වැදගත් වීමට හේතු තුනක් සඳහන් කරන්න. ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

2024.09

5.

i. කර්මාන්තයක් ස්ථානගතවීම සඳහා බලපාන සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. මෝටර් රථ කර්මාන්තයේ ප්‍රවණතා තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. ලෝක නිෂ්පාදන කර්මාන්ත මුහුණ දෙන පාරිසරික ගැටලු තුනක් නම්කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

6.

i. a. ඉන්ධනමය ඛනිජයක්

සහ

b. ලෝහමය ඛනිජයක් නම් කරන්න. (ලකුණු 02)

ii. ලෝකයේ දක්නට ලැබෙන ප්‍රධාන වනාන්තර වර්ග තුන නම් කරන්න. (ලකුණු 03)

iii. වනාන්තර හා වනජීවීන් මුහුණපාන ගැටලු තුනක් නම්කර ඉන් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

7.

i. ලෝක ජන සංඛ්‍යා වර්ධනයේ ප්‍රධාන අවධි දෙක නම් කරන්න. (ලකුණු 02)

ii. ලෝකයේ ජන හීන ප්‍රදේශ තුනක් නම්කර උදාහරණය බැගින් ලියන්න. (ලකුණු 03)

iii. ජන සංඛ්‍යාවේ අසම ව්‍යාප්තිය කෙරෙහි බලපාන සාධක තුනක් නම්කර ඉන් එක් සාධකයක බලපෑම නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

8.

i. සංවර්ධනය මැනීම සඳහා භාවිත කරන නූතන මිනුම් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම මගින් ලැබෙන ප්‍රයෝජන (වාසි) තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. අන්තර්ජාල සබඳතාවලින් ලැබිය හැකි වාසි දෙකක් සහ අවාසි එකක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

Learning Resource Center
R
De Mazenod College
Kandana

(ආ)




(i)

(ii)

(iii)

(iv)

(v)

5

(ඇ)




(i)

(ii)

(iii)

(iv)

(v)

5